


## 2011 නව අවුරුදු සුභ පැතුම

අපගෙන් ආධාර ලබන සියලුම දරුවන්ට, දෙමාපියන්ට හා දානපතින්ටත් මේ ලැබූ නව වසර ඉතාම වාසනාවන්ත හා පින්බර වසරක් වේවායි අපි ප්‍රාර්ථනා කරමු.

ලන්ඩන් නුවර ඉංජිනේරු හා ඉරිදා ලක්බිම පුවත්පතේ ලේඛක ගාල්ලේ දෙව්සිරි පී හේවාවිදාන මහතා හා එම මහත්මිය රුවිනි, ලක්සිරි හේවාවිදාන මහතා හා අප විසින් විදේශීයන්හි මිතුරන් සමඟ එක්වී අරඹන ලද (**U K Friends of Galle**), එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම, ගාලු හා මාතර පළාතේ දරුවන් සඳහා ඉතා අප්‍රසිද්ධියේ විශාල සේවයක් කරමින් සිටි.

වසර 2003 දී දෙව්සිරි මහතා, මැතිණිය හා දූ පුතුන් සමඟ ලංකාවට පැමිණ තමා මුලින්ම ඉගෙනගත් ගාල්ලේ හව්පේ විදුහලට තම ආදරණීය මෑණියන් අතින් පරිගණකයක්, පුස්තකාලයට අවශ්‍ය අලුත් පොත් සියල්ලම හා ක්‍රීඩා භාණ්ඩ පරිත්‍යාග කරමින් කෘතගුණ දැක්වීය. අප පදනම විසින් හව්පේ විදුහලේ සිසුනට අභ්‍යාස පොත් හා පාවහන්ද, බටේමුල්ල මහා විද්‍යාලයේ පුස්තකාලයට අවශ්‍ය අලුත් පොත්පත් සියල්ලද පරිත්‍යාග කරන ලදී.

දෙව්සිරි මහතාගේ ආදරණීය පියා වු දිවංගත සාම විනිසුරු දයාවංස චන්ද්‍රසිරි හේවාවිදාන මහතා තම ගමේ කඹුරුපිටියේ ආරම්භ කළ, උල්ලල මහා විදුහලේ සිසුනට පොත්පත් සහ සපත්තු අරන් දුන්නේද ගාලු මිතුරු පදනමේ දානපතියන්ගේ පාසැල් යන එංගලන්තයේ දූ පුතුන්ය. එසේම ලේනබටුවේ රතනපාල විදුහලේ පුස්තකාලයට අවශ්‍ය සියලුම පොත්පත් ද, උල්ලල හා මාස්මුල්ල විදුහල්වලට අලුත් පරිගණක හා පුස්වැල්කඩ කණිෂ්ඨ විද්‍යාලයේ හා අකුරුගොඩ රතනජෝති විදුහලේ දූදරුවන්ට සපත්තු හා පොත්පත් ලබා දුන්නේද ගාලු මිතුරු පදනමේ දානපතියන්ය.

මෙයට අමතරව මාස්මුල්ල කනිෂ්ඨ විද්‍යාලයට අංග සම්පූර්ණ නවීන පුස්තකාලයක් හා පන්ති කාමරයක් ගොඩනගා, සියලුම කියවීමේ පොත්පත් හා ඩෙස් බංකු සමඟ පරිත්‍යාග කළ ගාලු මිතුරු පදනමේ දානපතියන් එම විදුහලේ සෑම දරුවෙකුටම අවශ්‍ය පොත්පත්, ක්‍රීඩා භාණ්ඩ හා පාවහන් ද ලබා දුන්නාය. එසේම එංගලන්තයේ ගාලු මිතුරු පදනමේ දානපතිනි සමන්තා හා රිචඩ් කෙනර්ලි යුවල විසින් තනවන ලද චාර්ල්ස් කෙනර්ලි ඉංග්‍රිසි පුස්තකාලය, පොත්පත් හා පරිගණකය සමඟ අකුරුගොඩ රතනජෝති විදුහලේ දරුවන්ට අපි පරිත්‍යාග කළෙමු.

සුනාමියෙන් දෙමව්පියන් අහිමි වූ හෝ වෙනත් ආපදා වලින් අසරණ වූ දක්ෂ දුගී ළමුන් 217 ක් අද ගාලු මිතුරු පදනම මඟින් මසකට රුපියල් 500 හෝ 1000 බැගින් පිරිනමන ශිෂ්‍යත්වය පිහිටෙන් පාසැල් යති. සුනාමියෙන් ගෙවල් දොරවල් හා දූ පුතුන් අහිමි වූ පවුල් 7 කට ගාලු මිතුරු පදනම මඟින් නව නිවාස තනා පරිත්‍යාග කොට ඇත.

අප පදනමට මෙතරම් සුවිශාල සේවයක් කිරීමට හැකි වුයේ, දුප්පතාගේ දුකට පිහිට වන කාරුණික මැති මැතිනියන් නිසාය. මේ දක්වා අප පදනම හරහා දුගී පාසල් හා අසරණ දූ දරුවන් දහස් ගණනකට උදව් කල සියලුම දානපතීනට අපි බලවත් ලෙස ස්තූතිවන්ත වෙමු. ඉදිරියටත් දකුණේ අසරණ දරුවනට අපගේ සංවිධානය හරහා හැකි අන්දමට ඔවුන් පිහිටවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ඔබත් අසරණ හා දීප්තිමත් දරුවෙකුට ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කැමති නම් කරුණාකර ලක්සිරි හේවාවිදාන මහතා (077 6640810) හෝ මා අමතන්න. නැතිනම් දෙව්සිරි මහතාගේ **devsiri@hotmail.com** ඊමේල් ලිපිනයට ලියන්න. අප පදනම මේ දක්වා දකුණේ දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා කරන ලද සමාජ වැඩ කටයුතු පිලිබඳ වැඩි විස්තර **www.ukfg.net** වෙබ් අඩවියෙන් ඔබට බලා ගත හැකිය.

එසේම නැති බැරිකම නිසා පාසල් කටයුතු අතපසු වන හෝ අධ්‍යාපනය අතරමග නැවැත්වීමට සිදු ව ඇති ඉගෙනීමට ඉතා දක්ෂ දිළිඳු දරුවන් ගැන ඔබ දන්නේ නම් ශිෂ්‍යත්වයක් ලබා ගැනීම සඳහා ඔවුන් අපේ පොරොත්තු ලේඛනයට ඇතුලත් කල හැකිය. එවැනි දරුවන්ගේ දෙමව්පියන්ට සිරිසේන ගමගේ මහතාට ලිපියක් ලියා ඉල්ලුම් පත්‍රයක් ලබා ගන්නා ලෙස දන්වන්න.

දෙව්සිරි, රුවිනි යුවල, ලක්සිරි හේවාවිදාන, මහත්වරු හා නජීලා කාරියවසම් මහත්මිය ඇතුලු එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනමේ සියලුදෙනා සමඟ ඔබ පවුලේ සැමට ඉතාමත් වාසනාවන්ත නව වසරක් වේවායි පතමු.

මෙයට හිතාදර, ,
සිරිසේන ගමගේ
ලංකා සභාපති
එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනම,
"ගාමිණී", කෝට්ටෙ වත්ත, යටියන, මාතර.
දුරකථන අංක : 041-2245294 / 0779131763

## එක්සත් රාජධානියේ ගාලු මිතුරු පදනමෙන් පිරිනමන ලද නිවාසවලින් කිහිපයක්


BROOKSON HOUSE


FRICROFT & SMITHS


CASCO HOUSE


BOB DABBS HOUSE


PHARORA HOUSE


DE BEERS HOUSE



මාස්මුල්ල විද්‍යාලේ දූ දරුවන්ට නිල ඇඳුම් ලැබුණු දා..



උල්ලල දරුවන්ට සපත්තු ලැබී



මාස්මුල්ල විද්‍යාලට ලැබුණ අලුත්ම පුස්තකාලය


තෑගි ලැබූ තුම්බේ පාසල් දරුවන්






අකුරුගොඩ රතනජෝති විද්‍යාලට චාර්ල්ස් කෙනර්ලි පුස්තකාලය, පොත්පත් හා පරිගණකය පරිත්‍යාග කල දා



හච්පේ පාසැලට තෑගි ලැබුණු දා..


එංගලන්තයෙන් තෑගි ලැබූ පුස්වැල්කඩ දරු දැරියෝ



ගාලු මිතුරු පදනමෙන් ශිෂ්‍යත්ව ලැබූ දූ දරුවෝ

Devsiri ,Ruvini, Deshan, Dinum and Shynie Jananjalee, Hewavidana
72, Smithy Drive, Ashford, Kent, TN23 3NS, UK